# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

## මැයි මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.

**COVID-19 වසංගතයේ තුන්වන රැල්ල මගින් ඇතිවූ අහිතකර බලපෑම් යම් පමණකින් සමනය වීමක් පෙන්නුම් කරමින් ජුනි මාසය තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සුළු ප්‍රගමනයක් දක්නට ලැබුණි.** නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 මැයි මාසයට සාපේක්ෂව 2021 ජුනි මාසයේදී දර්ශකාංක 8.3 කින් ඉහළ යමින් 50.4 ක් ලෙස වාර්තා වූ අතර, නව ඇණවුම් උප දර්ශකයෙහි සිදුවූ සැලකිය යුතු ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය හැර අනෙකුත් සියලුම උප දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව ඉහළ යන ලදී.

විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. තවද, ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදන, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් පසුගිය මාසයට සාපේක්ෂව ඉහළ ගියද, වසංගතයේ තුන්වන රැල්ල මගින් ඇතිවූ බාධා හේතුවෙන්, තවදුරටත් කඩයිම් මට්ටමට වඩා පහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, ජුනි මාසය තුළදී රෙදිපිළි හා ඇඟලුම් අංශයෙහි පහත වැටීම එම අංශයට අදාළව නව ඇණවුම්, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් යන උප දර්ශක තවදුරටත් පහළ යාම තුළින් පිළිබිඹු විය.

| විචල්‍යය | මැයි | ජුනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **42.1** | **50.4** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 42.4 | 52.1 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 27.9 | 43.2 | - | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 38.4 | 45.8 | - | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 36.0 | 45.3 | - | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 73.8 | 68.9 | + | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021 ජුනි මාසය තුළ ඉහළ යාමේ වේගය අඩු වීම කෙරෙහි දේශීය වශයෙන් සංචරණ සීමා ලිහිල් කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් බොහොමයක්, විදේශයන්ට ගෙවීම් සිදුකිරීමේදී හා ආනයන සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී ප්‍රමාදයන්ට මුහුණදුන් බවත්, අපනයනකරුවන්හට හිස් බහාලුම් වල ඇති හිඟතාවයට අමතරව භාණ්ඩ නැව්ගත කිරීම සඳහා ඉඩ වෙන්කරගැනීමේ අපහසුතාවන්ද ඇතිවූ බවත් සඳහන් කරන ලදී.


රට තුළ, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ COVID-19 එන්නත්කරණය කඩිනම් කිරීමේ වැඩපිළිවෙල සහ සංචරණ සීමා ලිහිල් කිරීමත් හේතුවෙන්, ඉදිරි මාස කිහිපය තුළ ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වනු ඇතැයි යන අපේක්ෂාවත් සමඟ ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**50.4**

**2021 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 8.3ක ඉහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5 කින් පහළ යමින් 2021 ජුනි මාසයේදී 55.5ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 ජුනි මාසයේදී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව යුරෝපා කලාපයෙහි වැඩි වේගයකින්ද එක්සත් රාජධානියෙහි සමාන වේගයකින්ද ඉහළ යන ලදී, එක්සත් ජනපදය සහ චීනයෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලද අතර, ඉන්දියාව සහ රුසියාවෙහි එම දර්ශක පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 ජූලි 14 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, අඛණ්ඩව මාස දෙකක් පහත වැටීමෙන් පසුව, 2021 ජූනි මාසයේ දී 51.3ක දර්ශක අගයක් වාර්තා කරමින් වර්ධන කලාපයට නැවත පැමිණියේය.** මෙම වර්ධනය සඳහා සංචරණ සීමා ලිහිල් කිරීම හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදුවූ ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

ප්‍රධාන වශයෙන්, අධ්‍යාපන සහ මූල්‍ය සේවා යන උපඅංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, නව ව්‍යාපාර උප දර්ශකය 2021 මැයි මාසය හා සසඳන විට 2021 ජූනි මාසයේ දී වර්ධනය විය. එසේ වුවද, තොග හා සිල්ලර වෙළඳාම, නවාතැන් හා ආහාරපාන සැපයීම සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උපඅංශවල මෙම මාසයේ දී පහළ යෑම් දක්නට ලැබුණි.

ජූනි මස අග වන විට සංචරණ සීමා ලිහිල් කිරීමට සමාගමීව ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකය වර්ධනය විය. ඒ අනුව, රක්ෂණ, අධ්‍යාපන, වෘත්තීය සේවා සහ ප්‍රවාහන යන උප අංශ වල වර්ධනයන් දක්නට ලැබුණි. එසේ වුවද, COVID-19 වසංගතයේ තෙවන රැල්ල පැතිරීම හේතුවෙන් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ හා සේවා සඳහා වන ඉල්ලුම පහත වැටීම මධ්‍යයේ තොග හා සිල්ලර වෙළඳාම, අනෙකුත් පෞද්ගලික සේවා, නවාතැන් හා ආහාරපාන සැපයීම සහ දේපළ වෙළඳාම යන උපඅංශ අඛණ්ඩව පහත වැටුණි.

ව්‍යාපාර අවශ්‍යතාවල අඩු වීමත් සමඟ නව බඳවා ගැනීම් සිදු නොකිරීම සහ විශ්‍රාම යෑම් හා සේවයෙන් ඉවත්වීම් හේතුවෙන් සේවා නියුක්තිය ජූනි මාසයේ දී අඩු වේගයකින් නමුදු අඛණ්ඩව පහළ ගියේය.

දිවයින පුරා සංචරණ සීමා තවදුරටත් දීර්ඝ කිරීම සහ ප්‍රාදේශීය හුදකලා කිරීම් හමුවේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා ඇති වූ බාධා හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් ජූනි මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

| විචල්‍යය | මැයි | ජූනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **39.5** | **51.3** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 36.3 | 49.0 | - | අඩු වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 28.9 | 49.0 | - | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 32.8 | 46.1 | - | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 60.9 | 54.2 | + | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 38.6 | 58.3 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සංචරණ සීමා ලිහිල් කිරීම හේතුවෙන් වර්ධනය වූ සුබවාදී අදහස් සමඟ ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් මැයි මාසයට සාපේක්ෂව ඉහළ ගිය අතර, සමහර ප්‍රතිචාර දක්වන්නන් ආනයන සීමා කිරීම් හේතුවෙන් ඔවුන්ට ඇතිවන බාධා සඳහන් කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**51.3**

**2021 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 11.8ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරන නමුත්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 මැයි මාසයේ පැවති 59.6 සිට 2021 ජූනි මාසයේ දී 57.5 දක්වා පහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 ජූනි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ඉන්දියාව සහ ජපානය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 ජූලි 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.